## අනුග්‍රාහකයන්

FECT සඳහා UNDP, IDRC, ICTP, IMD, APN, IMD, APCC, LDEO, BCC, NSF-Sri Lanka යන ආයතනයන්හි දායකත්වයන් ලබා දෙන ලදී.

## නිළධාරී මණ්ඩලය

| | |
|---|---|
| ලරීෆ් සුබෙර් | : ප්‍රධාන විද්‍යාඥ / ඉංජිනේරු |
| රිම්සා සකී | : ගණකාධිකාරී |
| P. වික්‍රමගමගේ | : භූගෝල විද්‍යාව |
| P.H.D. කුසුමාවතී | : ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ |
| ජනන් විශ්වනාදන් | : තොරතුරු තාක්ෂණවේදී |
| රුචිර ලොකුහෙට්ටි | : භෞතික විද්‍යාඥ |
| තුවාන් හජ්ජි | : පරිපාලක |
| ෆාතිමා ශාකිරා | : ලේකම් කටයුතු |
| ආශාරා නිජාම්දීන් | : කෘෂිකර්ම විද්‍යාව |
| ශිෆ්නා රමීස් | : සන්නිවේදන |
| මහසෙන් රත්දිවෙල | : භූගෝල විද්‍යාව |
| රුෂ්ඩා සාලි | : පරිසර විද්‍යාව |

## උපදේශකයින්

| | |
|---|---|
| මයිකල් බෙල් | : දේශගුණික තොරතුරු තාක්ෂණය |
| අජිත් ගුණරත්න | : ව්‍යවහාරික ගණිතය |
| H. මන්ත්‍රිතිලක | : ජල සම්පත් ඉංජිනේරු |
| නලින් වික්‍රමනායක | : වෙරළ හා ජල සම්පත් |
| නීල් දේවදාසන් | : පද්ධති ඉංජිනේරු |
| විදුර රළපනාව | : තොරතුරු තාක්ෂණවේදී |
| M. සහීඩ් | : දේශගුණ විද්‍යාව |

## විද්වතුන්

| | |
|---|---|
| රත්මලී බණ්ඩාර | : ඉඩම් මතුපිට ආකෘති නිර්මාණය |
| මධුර වීරසේකර | : GIS සහ ස්වභාවික සම්පත් |
| සෙව්වන්දි චන්ද්‍රසේකර | : ජල කළමනාකරණය |
| සංජය රත්නායක | : තොරතුරු තාක්ෂණය |

## අත් පත්‍රිකාව නිර්මාණය

• චායන ගුණතිලක • තුවාන් හජ්ජි • ශිෆ්නා රමීස්

## අප ගැන

මෙහෙවර

සමාජ අවධානය හා පාරිසරික ආරක්ෂාව සඳහා දේශගුණ, පරිසර හා තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් ගුණාත්මක පර්යේෂණ සමාජයට දායාද කිරීම.

## අපගේ දායකත්වයන්

අප විසින්,

» කාලගුණය සහ පාරිසරික පර්යේෂණ සිදුකිරීම.
» දේශගුණික අනුවර්තන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
» පර්යේෂණ සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
» 1997 සිට කාර්ය මණ්ඩලයේ 55ට වැඩි තරුණ ශ්‍රමිකයන් පිරිසක් පුහුණු කිරීම.

ඉහත සත්කාරයන් සිදු කිරීම සඳහා අප ආයතනය පරිසර, දේශගුණය සහ තාක්ෂණ පදනම (FECT) ලෙස 2003 දී ලාභ නොලබන ආයතනයක් ලෙස ලියාපදිංචි කරන ලදී. FECT අපි දේශගුණය, ජල විද්‍යාව, අනුගතවීම, තොරතුරු තාක්ෂණය, සමාජ විද්‍යාව හා ඉංජිනේරු යන අංශයන් තුලින් තිරසාර සංවර්ධනයට දායක වෙමු. අපගේ ප්‍රතිපත්තිය වන්නේ කිසිදු ලාභයක් නොලැබ සමාජ සුභසාධනය සඳහා කටයුතු කිරීමයි.

## ආයතනික පැතිකඩ

| | |
|---|---|
| සමාගම් නාමය | : පරිසර, දේශගුණය හා තාක්ෂණ පදනම |
| ලියාපදිංචි අංක | : N(A)1148 & GA 56 (2008 සිට) |
| සංස්ථාගත කිරීම් දිනය | : දෙසැම්බර් 31, 2003 |
| සමාගම් ලේකම් | : රළපනාව ඇෂෝසියේට්ස් |
| විගණකාධිපති | : අන්සාරී සහ සමාගම |
| බැංකුකරුවන් | : මහජන බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව |

## වෙබ් අඩවි හා සමාජ මාධ්‍ය

| | |
|---|---|
| Websites | : http://www.climate.lk<br>http://www.tropicalclimate.org |
| Facebook | : http://facebook.com/fectsl |
| Twitter | : http://twitter.com/fectlk |
| Wordpress | : http://srilankaclimate.wordpress.com |
| Blogger | : http://fectlk.blogspot.com |

## සබඳතා


පාරිසරික දේශගුණය හා තාක්ෂණය සඳහා පදනම,
76/2 මාතලේ පාර අකුරණ, KY 20850, ශ්‍රී ලංකාව.
දුරකථන: + 94-81-2376746, + 94-81-2300415
විද්‍යුත් තැපැල : info@tropicalclimate.org
: fectsl@gmail.com


FECT

Foundation for Environment, Climate and Technology

# FOUNDATION FOR ENVIRONMENT CLIMATE AND TECHNOLOGY



දේශගුණික සේවා



දේශගුණික අනුවර්තන සහ පරිසරය



අධ්‍යාපනය සහ පුහුණුව

# දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති

### ශ්‍රී ලංකාව සහ මාලදිවයින ආශ්‍රිතව වන නියං ගංවතුර සහ නායයාම් ආපදා දත්ත සියුම් ඇගයීමට ලක් කර අනාවැකි කිව හැකිද?




නියඟය හා ගංවතුර බලපෑම් ඇස්තමේන්තු කිරීම සඳහා අවදානම් විශ්ලේෂණ රාමුව සංවර්ධනය කිරීම සහ මෙම කාලගුණික හා දේශගුණික වෙනස්වීම් මත සිදුවන්නා වූ ක්‍රියාවලීන් සිතියම් ගත කිරීම. මේ සඳහා ඇමරිකානු ජාතික විද්‍යා ඇකඩමිය මගින් අරමුදල් සපයනු ලැබුණි.

### කඳුකරයේ තේ වගාවන්ට දේශගුණික විචල්‍යතාවයේ සහ වෙනස්වීම් වල බලපෑම.



ශ්‍රී ලංකාවේ තේ වැවිලි පද්ධති මත දේශගුණය බලපෑම් තක්සේරු කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අපගේ හවුල්කරුවන් සමග Tropical Climate, පාරිසරික, දේශගුණික හා තාක්ෂණික පදනම (FECT) , විසින් මෙම ව්‍යාපෘතිය සැලසුම් කරන ලදී. තේ නිෂ්පාදනයේ, අස්වැන්න හා ගුණාත්මකභාවය කෙරෙහි ඇති බලපෑම් සඳහා මූලික වශයෙන් අවධානය යොමු කරයි.

### මහවැලි ජල සම්පත් කළමණාකරණය සඳහා දේශගුණික තොරතුරු සැපයීම. (2004-4, 2008- අද දක්වා)



ජල සම්පත් කළමනාකරණය සඳහා දේශගුණික තොරතුරු උත්පාදනය කිරීමට මෙවලම් ගොඩනැගීම. සහ FECT මගින් 2008 සිට මහවැලි අධිකාරිය (MASL) වෙත සතිපතා ජල-කාලගුණ-විද්‍යාත්මක උපදේශන සේවා සැපයීම. මේ සඳහා IRI, මහවැලි අධිකාරිය, IFS (ස්විඩනය) මගින් අරමුදල් සපයනු ලැබුණි.

# නිම කරන ලද ව්‍යාපෘති

### ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා නියඟය අධීක්ෂණය හා දේශගුණික වෙනස්වීම් තක්සේරු කිරීම. (2014-17)



නියං අවදානම් අධීක්ෂණය කිරීමට හා දකුණු ආසියානු කලාපයේ නිශ්චිත කාල පරාසයකදී (අවුරුදු 20 දක්වා) දේශගුණික විපර්යාස නිගමනයේ පවතින අඩුපාඩු සඳහා මාලදිවයිනේ ජාතික විශ්වවිද්‍යාලය සමග එක්ව මෙවලම් ගොඩනැගීම. මේ සඳහා ඇමරිකානු ජාතික විද්‍යා ඇකඩමිය මගින් අරමුදල් සපයනු ලැබුණි.

### බෝග ආකෘති නිර්මාණය.



බෝග අස්වැන්න ප්‍රක්ෂේපණය සඳහා යෝජනාවක් සකස් කිරීම සඳහා දකුණු ආසියාතික උපාය මාර්ගික සංවර්ධන කේ.සී.එෆ්.එස් ආයතනයට දායක වූ අතර, ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද සහාය විය. මේ සඳහා CGIAR දේශගුණික වෙනස්කම්, කෘෂිකර්ම හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන (CCAFS) මගින් අනුග්‍රහය ලබා දෙනු ලැබිය.

### ජල සම්පත් කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාව හා මාලදිවයින අශ්‍රිත කන්න පිළිබඳ දේශගුණික අනාවැකි සැපයීම.




මෙමගින් ශ්‍රී ලංකාවේ ඉහළ දේශගුණික විචල්‍ය ස්වභාවය දින කිහිපයක සිට මසක් දක්වා නිර්ණය කොට අදාල දේශගුණික වාර්තා ජාතික ජල කළමනාකරුවන්ට ලබා දේ. ප්‍රධාන අධ්‍යයන ලෙස ශ්‍රී ලංකාවේ මහවැලි ගඟට අනුබද්ධ පිහා ඔය ජල පෝෂක ආශ්‍රිතව ගංවතුර ඇතිවීම සහ මාලදිවයිනේ "ග්‍රේටර් මාලේ" කලාපයේ නියඟයට බලපාන හේතූන් අධ්‍යයනය කරන ලදී. අප විසින් දේශගුණික බලපෑම් අනුව කන්න අනාවැකි තක්සේරු කරන ලදී. මේ සඳහා ඇමරිකානු ජාතික විද්‍යා ඇකඩමිය මගින් අරමුදල් සපයනු ලැබුණි.


### තිරසාර සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව පේරාදෙණිය විශ්වවිද්‍යාලය. (2010 -16)



තිරසාර සංවර්ධනය පිළිබඳව අවධානය යොමු වූ පශ්චාත් උපාධි පාඨමාලාව ඉදිරියට ගෙන යාම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට සහාය ලබා දුන් අතර ආධුනිකයින් සඳහා වන විෂයමාලා සංවර්ධනය, ඉගැන්වීම, පර්යේෂණයන්ට ද සහාය ලබා දුනි. එසේම ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ සමීක්ෂණ ව්‍යාපෘති භාරගැනීම සහ කුසලතා සංවර්ධනයද සිදු කරන ලදී. මේ සඳහා මැක්ආතර් පදනම විසින් අරමුදල් සපයනු ලැබුණි.

### ශ්‍රී ලංකාවේ සහල් කෘෂිකර්මික පද්ධති හා ආහාර ආරක්ෂාව පිළිබඳ දේශගුණික විපර්යාස මගින් ඇති වූ බලපෑම නිරූපණය කිරීම.

කුරුණෑගල දිස්ත්‍රික්කය පිළිබඳව අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාව




පුරා කෘෂිකර්මය මත ඇති කරන ලද දේශගුණික විපර්යාස බලපෑම් ආර්ථික ආකෘති නිර්මාණ මගින් හඳුනා ගැනුණි. මෙම කාර්යය පේරාදෙණිය, රුහුණු හා රජරට විශ්වවිද්‍යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා උක් පර්යේෂණ ආයතනය සමඟ එක්ව සිදු කරන ලදී. මේ සඳහා AgMIP මගින් අරමුදල් සැපයුණි.

### ශ්‍රී ලංකාවේ ඩෙංගු අවදානම සහ දේශගුණය අතර ඇති සම්බන්ධය තක්සේරු කිරීම. (2010-11)




ඍතු වෙනස් වීම අනුව ශ්‍රී ලංකාවේ ඩෙංගු අවදානම හා දේශගුණය අතර ඇති සම්බන්ධය තක්සේරු කළ අතර මෙහි සොයා ගැනීම් යෝජනාවක් දක්වා ගොඩ නගන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා WHO - SEARO ආයතන විසින් අරමුදල් සපයනු ලැබුණි.

### ශ්‍රී ලංකාවේ කාලගුණ වෙනස් වීම් හා සහල් නිෂ්පාදනය. (2000, 2010)



ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක විසින් කරනු ලැබූ සහල් නිෂ්පාදනය හා එල්-නිනෝ අතර සම්බන්ධතාවය මෙම ව්‍යාපෘතියේදී විශ්ලේෂණය කෙරුණි. SEARCA-FAO මගින් අරමුදල් සපයන ලදී.

### උදම් කඩතොළු මත දේශගුණික වෙනස්වීමේ බලපෑම. (2009)



අප විසින් දේශගුණික වෙනස්වීම් යටතේ සිදුවන ඍතුමය සහ කලාපීය රළ ගැලීම් වෙනස්වීම පැහැදිලි කරනු ලැබුණි. UNESCO-IHE මගින් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලැබුණි.

### වැසි ජලය කළමණාකරණය මගින් ඉදිරි කාලයන්හි දී ඇති විය හැකි නියං තත්වයන් සඳහා පෙර සූදානම් වීම.(2007-08)



අප විසින් වැසි ජලය කළමනාකරණය උදෙසා ජල හිඟය ඇස්තමේන්තු කිරීම හා කාලගුණය විශ්ලේෂණය කිරීමට පියවර ගන්නා ලදී. මෙම ව්‍යාපෘතියට අදාල සැලසුම් හා නිර්මාණ හඟුරන්කෙත දී සිදු කෙරුණි. ProVention මූල්‍ය ආයතනය මගින් අරමුදල් සැපයිණි.

### ශ්‍රී ලංකාවේ මැලේරියාව පැතිරයාමේ අවධානම සඳහා දේශගුණික බලපෑම් අධ්‍යනය කිරීම. (2003-08)



අප විසින් දේශගුණික වෙනස්වීම් හා මැලේරියා අවදානම අතර සම්බන්ධතාව, මැලේරියා මර්ධන වැඩසටහන, IRI සහ ජාතික ජල කළමනාකරණ ආයතනය සමඟ එකාබද්ධව පැහැදිලි කරන ලදී. NOAA මගින් අරමුදල් සපයනු ලැබුණි.

### දේශගුණය හා ස්වාභාවික විපත් අවධානම. (2002-05)



මෙම ව්‍යාපෘති මගින් විවිධ ස්වභාවික විපත් (ගංවතුර, නියඟ, නායයෑම්, කුණාටු) හේතුවෙන් සිදුවන අවදානම් තත්ව හඳුනා ගන්නා ලදී. මෙයට පෘථිවි අධ්‍යන ආයතනය හරහා ලෝක බැංකුව අරමුදල් සපයන ලදී.

### දේශගුණික වෙනස්වීමෙන් තේ සහ පොල් වගාවට සිදුවන බලපෑම. (2002-05)



මෙම ව්‍යාපෘතිය මගින් තේ හා පොල් වගාවන් කෙරෙහි දේශගුණික විපර්යාස වල බලපෑම අධ්‍යනය කෙරිණි. පොල් පර්යේෂණ ආයතනය සහ තේ පර්යේෂණ ආයතනය මගින් මෙම ව්‍යාපෘතිය දියත් කල අතර ඒ සඳහා IRI සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ද දායක විය. මේ සඳහා ශ්‍රී ලංකා විද්‍යා අභිවෘද්ධි සංගමය සහ SysTem for Analysis, Research and Training (START) ආයතනය මගින් අනුග්‍රහය ලබා දුනි.

### දේශගුණය හා අලි මිනිස් ගැටුම. (2001-04)



අප විසින් MASL, EFCD හා DWLC ආයතන වල උපකාරයෙන් දේශගුණය මගින් සිදු වන අලි මිනිස් ගැටුමට සිදු කරන බලපෑම හඳුනා ගැණුනි. පෘථිවි අධ්‍යන ආයතනය මෙම ව්‍යාපෘතියට අදාලව අනුග්‍රහය ලබා දුනි.